**කැලණිය විශ්වවිද්‍යාලය**
**සමාජීයවිද්‍යා පීඨය**

# භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය මගින් මෙහෙයවන භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2022

උක්ත පාඨමාලාව සඳහා මතු දැක්වෙන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත්‍ර 2022 පෙබරවාරි 28 දක්වා භාරගනු ලැබේ.

**සුදුසුකම්:**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් ඕනෑම විෂයයන් තුනකින් සමත් වීම

හෝ

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව, විද්‍යාව ඇතුළුව විෂයයන් හයකින් සමත්වීම සහ භූගෝලීය තොරතුරු පද්ධති ක්ෂේත්‍රයකට අදාල වසර දෙකක වෘත්තීමය පළපුරුද්ද ලබා තිබීම

හෝ

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඕනෑම විෂයයන් හයකින් සමත්වීම සහ භූගෝලීය තොරතුරු පද්ධති ක්ෂේත්‍රයකට අදාල වසර හතරක වෘත්තීමය පළපුරුද්ද ලබා තිබීම

හෝ

කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගනු ලබන අධ්‍යාපන හෝ වෘත්තීමය සුදුසුකම් ලබා තිබීම

සහ

මූලික පරිගණක සාක්ෂරතාවය තිබීම

**තෝරා ගැනීමේ පිළිවෙල**

සියලුම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, ඉන් සමත්වන අය පමණක් පාඨමාලාවට බඳවා ගනු ඇත.

මෙම පාඨමාලාව රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සංවිධානයන්හි සේවයේ නියුතු පිරිස්වලට මෙන්ම භූගෝලීය තොරතුරු පද්ධති ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යයනය කිරීමට කැමැත්තක් දක්වන සියලු දෙනා වෙනුවෙන් සැළසුම් කර ඇත.

**පාඨමාලා කාලය :**

එක් අධ්‍යයන වර්ෂයකි (අර්ධ වාර්ෂික දෙකකින් සමන්විත වේ). දේශන සහ ප්‍රායෝගික පන්ති සෑම ඉරිදා දිනකම පෙරවරු 9.00 සිට පස්වරු4.00 දක්වා පැවැත් වේ.

**මාධ්‍යය :** ඉංග්‍රිසි සහ සිංහල

**පාඨමාලා ගාස්තු :** රුපියල් 65,000 (සියලු ගාස්තු ඇතුලත්ව වාරික දෙකකින් ගෙවිය හැකිය)

**අයදුම්පත් :**

කැලණිය මහජන බැංකු ශාඛාවේ 055-100130667553 දරණ කැලණිය විශ්වවිද්‍යාලයීය ගිණුමට බැර වන සේ කැලණිය මහජන බැංකු ශාඛාවට රු. 750.00ක අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබාගත් බැංකු රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් පාඨමාලා අයදුම්පත්‍රය සහ විස්තර පත්‍රිකාව ලබාගත හැකිය.

http://ss.kln.ac.lk/depts/geography/ යන භූගෝලවිද්‍යා අධ්‍යයන අංශයේ වෙබ් පිටුවෙන් ද අයදුම්පත්‍රය ලබාගත හැකිය. එසේ ලබාගත් අයදුම්පත්‍රය සම්පූර්ණ කර අදාල බැංකු රිසිට්පත සමග අධ්‍යයන අංශය වෙත සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පැමිණ භාර දීම හෝ තැපෑලෙන් එවිය හැකිය.

අයදුම්පත් තැපෑලෙන් ඉල්ලුම් කරන්නේ නම්, ඉල්ලුම් කරන කවරයේ වම්පස ඉහළ භූගෝලීය තොරතුරු පද්ධති ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළයුතු අතර අදාල බැංකු රිසිට්පත සමග ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය ලියූ රු 15.00ක් වටිනා මුද්දරයක් ඇලවූ "9 X 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් පහත දැක්වෙන ලිපිනයට යොමු කිරීමෙන් ද අයදුම්පත් ලබාගත හැකිය.

**අයදුම්පත් 2022. 01. 25 දින සිට නිකුත්කරනු ලැබේ.**
**(දෙපාර්තමේන්තු වෙබ් පිටුව තුලින් 2022/01/25 දින සිට අයදුම්පත් ලබාගත හැකිය.)**

**විමසීම්/ අයදුම්පත් එවිය යුතු ලිපිනය:**

සම්බන්ධීකාරක
භූගෝලීය තොරතුරු පද්ධති ඩිප්ලෝමා පාඨමාලාව
භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
**දුරකථන:**
0719936119/0112903925/0702558912/0112903927/0715524646/0112903916

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
2022. 01. 28

මෙම දැන්වීම සෙ.මී. 12×20 ප්‍රමාණයේ හෝ ඊට කුඩාවිය යුතුය.